**උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 05/2016**

මගේ අංකය NP/07/10/02/89
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත,
යාපනය.
15.06.2016

**ප්‍රධාන ලේකම්,**
අමාත්‍යාංශ ලේකම්වරුන් ,
නියෝජ්‍ය ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
**උතුරු පළාත.**

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ III, II හා Iවැනි ශ්‍රේණියේ සිටින නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2015 (2016)**

**2014.08.15** දිනැති හා අංක **1875/39** දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකසමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවාව්‍යවස්ථා සංග්‍රහයට අනුව පිළියල කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථාවේ ඡේදය 9 හා 14 හිසඳහන්වූ විධිවිධානයටද, අන්තර්කාලීන විධිවිධාන සහ ඇමුණුම්02, 03 හා 04හි විධිවිධානයන්ට අනුකූලව පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ III, II හා Iවැනි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලෙකම් විසින් **2016 අගෝස්තු මාසයේදී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0මෙම විභාගය යාපනය හා වවුනියාව යන නගර වල පැවැත් වේ. එමනගර වලට අදාළ වන නගර අංක පහතින් දැක්වේ,මෙහිදී ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති වුවහොත් හෝ වෙනත් කාරණාවන් මත විභාග ස්ථාන මාරු කිරිම සම්බන්ධව තිරණ ගැනිම භලය රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමාට ආදාළ වේ. අයදුම්පත්‍රයේ සඳහන් වු නගරය පසු කාලයේ දි මාරු කිරිමට ඉඩ දෙනු නොලැබේ.

| **නගරය** | **නගර අංකය** |
|---|---|
| යාපනය | 01 |
| වවුනියාව | 03 |

3.0 **සුදුසුකම්:-** තනතුරට ආදාල වන සේවා ව්‍යවස්ථාවට අනුව මෙම සේවයේ ආදාළ පන්තිවලට පත්වීම් ලබා ගත්/උසස් වීම් ලබා ගත් නිලධාරින්ට හා මෙතක් මෙම විභාගය සම්පූර්ණ කර නොමති නිලධාරින්ද මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇත.

4.0 ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍රය අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2016.07.08**වන දින හෝ ඊට පෙර ලැබෙනසේ **ලේකම්,පළාත් රාජය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක:393/48, කෝවිල පාර,යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා ආදාල තොරතුරු සපයා නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

5.0 **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව:-** අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.( pass port )

(iii) වලංගු රියදුරු බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුගේ අනන්‍යතාව අවලංගු කළ හැකිය.

6.0 **අයදුම්පත්‍රය :-** අංක 1 සිට 6 දක්වා ඡේදයන් පළමුවන පිටුවටද අනෙකුත් විෂයන් දෙවන පිටුවටදඇතුළත් වන පරිදි'ඒ 4'ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙළ කළ යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය මගින් පිළියෙල කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, අයදුම්පත්‍රයේ ඡායාපිටපතක් හෝ වෙනත් පිටපත් භාර ගනු නොලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර විභාග කොන්දේසි වල සඳහන් වූ පරිදි අකෘති පත්‍රයට අනුව තිබීම සම්බන්ධව අපේක්ෂකයා අවධානය යොමු කල යුතු අතර ඡායාපිටපතක් තමන් ලග තබා ගැනීම ප්‍රයොජනවත්වනු ඇත.

7.0 **විභාග ගාස්තුව:-**

7.1 පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේකදු වුවත් ඉන්පසු වාරවල දි නිලධාරීන් විසින් විභාගයට පෙනී සිටි නම් රු 200.00 වටිනා මුදල් ඇණවුමක් උතුරු පළාතේ ඇති තැපැල් කාර්යාලයකින්, **උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමාගේ නමට හා යාපනය මත්‍ය තැපැල් කාර්යාලයේදී මාරු කරන හැකි පරිදි** ලබාගත් මුදල් ඇණවුමක් අයදුම්පත්‍ර සමග එවිය යුතුය. එම මුදල් ඇණවුමකින් ඡායාපිටපතක් තමන් ලග තබා ගැනීම ප්‍රයොජනවත්වනු ඇත.

7.2 කුමන හේතුවක් නිසාවත් මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන බවත් එම ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කළ නොහැකි බවත් දන්වා සිටිමි.

8.0 අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන්ට පලාත් රාජය සේවා කොමිෂන් සභාව ලෙකම් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබයි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටමට ඉඩදෙනු නොලැබේ. යම් අපේකෂකයකුට විභාගයට දින 03 ට පෙර ප්‍රවේශපත්‍ර නොලැබුනි නම් ඔහු **පළාත් රාජය සේවා කොමිෂන් සභා ලේකම්තුමාට** ඒ සම්බන්ධව පහත සඳහන් විස්තර සමඟ දැන්විය යුතුය.

- (i) ඉල්ලුම්කල ලිපිය
- (ii) ඉල්ලුම්පත්‍රයේ පිටපත
- (iii) මුදල් ඇණවුමේ සහතික කල පිටපත
- (iv) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ෆැක්ස් අංකයක් (Fax No)
- (v) අයදුම්පත තැපැල්කල තැපැල් කාර්යාලය, ලියාපදිංචිකල අංකය හා දිනය

9.0 මෙම විභාගයට අදාළ ප්‍රවේශ පත්‍ර ලැබී ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තුප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10.0 මෙම විභාගයට පෙනී සිටි අයදුම්කරුවන්ගේ විභාගප්‍රතිඵල උතුරු පළාත් රාජය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරන ලැබේ.

11.0 **විභාග පරිපාටිය** (මෙම විභාගය සමත් වීම සඳහා 40%ක නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.)

11.1 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ IIIවැනි ශ්‍රේණියේ නිලධාරින් සඳහා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

## 1.විෂය නිර්දේශය:-

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | 1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම |
| වාචික පරීක්ෂණය:- පහත සඳහන් විෂය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කරනු ලැබේ.<br>1. ආයතන සංග්‍රහයේ විධිවිධාන හා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම<br><br>2. රජයේ වාහන පරිහරණය හා නඩත්තුව පිළිබඳ දැනුම | පරිවාස කාලය, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, අතිකාල දීමනා, නිවාඩු, දුම්රිය බලපත්‍ර, ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග, සාමාන්‍ය හැසිරීම හා විනය<br><br>* මෝටර් රථ රියදුරන්ගේ රාජකාරී සහ වගකීම<br>*රජයේ වාහන නඩත්තු කිරීම හා ආරක්ෂාව සම්බන්ධයෙන්රියදුරුගේ වගකීම<br>* දෛනික ධාවන සටහන් පොත<br>* වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම<br>* වාහන අළුත්වැඩියාව හා සේවා කටයුතු<br>* රජයේ වාහන වලට සිදුවන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන්ගත යුතු ක්‍රියාමාර්ග |

## 2.ලකුණු දීමේ ක්‍රමය:-

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රයෝගික පරීක්ෂණය | 50 | 20 |
| වාචික පරීක්ෂණය | 50 | 20 |
| එකතුව | 100 | 40 |

❖ වාචික හා ප්‍රයෝගික විභාගය දෙකම එකවරකදී සමත්විය යුතුයි.

11.2 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ IIවැනි ශ්‍රේණියේ නිලධාරින් සඳහා දෙවෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පහත සඳහන් විෂය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක මගින් පරීක්ෂා කරනු ලැබේ.

## 1. විෂය නිර්දේශය:-

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. මහාමාර්ග නීති පිළිබඳ ප්‍රයෝගික දැනුම<br><br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගතවූ සේවා කාලය තුළ සිදු වී ඇති පටිපාටිමය, නීතිමය වෙනස්වීම් හා නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෂ්ඨත්වයට ගැලපෙන පරිදි වර්ධනය වී ඇත්දැයි මැන බැලීම සිදු කෙරේ |

## 2.ලකුණුදීමේ ක්‍රමය:-

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රයෝගික දැනුම<br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50<br><br>50 | 20<br><br>20 |
| එකතුව | 100 | 40 |

❖ ප්‍රවීනතාවය දෙකම එකවරකදී සමත්විය යුතුයි.

11.3 උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ Iවැනි ශ්‍රේණියේ නිලධාරින් සඳහා තුන්වෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පහත සඳහන් විෂය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක මගින් පරීක්ෂා කරනු ලැබේ.

1. **විෂය නිර්දේශය:-**

| විෂය ක්ෂේත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රයෝගික දැනුම<br><br>2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මහාමාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව දැනුමට අමතරව නිලධාරියාගේ ශිල්පීය ප්‍රවීණතාවය එම නිලධාරියාගේ ජ්‍යෙෂ්ඨත්වයට ගැළපෙන පරිදි වර්ධනය වී ඇත්ද යන්න හා නිලධාරියා සේවය කරන ආයතනයට පැවරෙන කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගෙන ඇත්ද යන්න මැන බැලීම සිදු කෙරේ. |

## 2.ලකුණුදීමේ ක්‍රමය:-

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| නිපුණතා පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය<br>1.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රයෝගික දැනුම | 50 | 20 |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 50 | 20 |
| එකතුව | 100 | 40 |

❖ ප්‍රවීනතාවය දෙකම එකවරකදී සමත්විය යුතුයි.

12.0 මෙම චක්‍රලේඛයේ සඳහන්වූ විෂය ඔබේ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ කාර්යාලවල සේවය කරන අදාළ නිලධාරින්ට දැනුම් දනලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. තවත මෙම තොරතුරු උතුරු පළාත් www.np.gov.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

**සටහන:-** මෙම විභාග දැන්වීමේ ඇතුලත් කර නොමැති යම් විෂයක් සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්තුමාගේ තීරණය අවසන් තීරණය වේ. **ඒ සමගම දෙමළ භාෂාවේ හි හෝ සිංහල භාෂාවෙහි යම් කිසි වෙනසක් ඇතොත් දෙමළ භාෂාවෙන් සදහන් නිවේදනය නිවැරදි බව සැළකිය යුතු වේ.**

ආර්.වරදලිංගම්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවාකොමිෂන් සභාව,
උතුරු පළාත.

***ආදර්ශ අයදුම්පත්‍රය***

**උතුරු පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ III, II හා I වැනි ශ්‍රේණියේ සිටින නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය-2015 (2016)**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල -S, දෙමළ-T
(අදාළ අකුරක් කොටුව තුළ ලියන්න)

| නගරය | නගර අංකය |
|---|---|
| | |

(දැන්වීමේ 02 වන පන්තියේ සඳහන් වූ පරිදි ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය සඳහන් කරන්න)

1.

1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :-
..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ :SILVA, A. B.

1.2 මුලකුරු සමග නම:-මයා/මිය/මෙනෙවිය ..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුල් අකුරුන් සඳහන් වන නම :-..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.4මුල් අකුරුන් සඳහන් වන නම :-..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.සේවය කරන ස්ථානය හා ලිපිනය (මෙම ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍ර යවනු ලැබේ)

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්
..........................................................................................
..........................................................................................
..........................................................................................

2.2 සිංහලෙන්/දෙමළෙන්
..........................................................................................
..........................................................................................
..........................................................................................

2.3 දුරකතන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ -0
ස්ත්‍රී -1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

5.අයදුම් කළ විභාගයේ නම (සුදුසු ශ්‍රේණියට ඉතිරියේ ලකුණු කරන්න)

| **අංය** | **ශ්‍රේණිය** | **පෙනීමට අපෙසෂ කරන විභාග** |
|---|---|---|
| 01 | ශ්‍රේණියIII | |
| 02 | ශ්‍රේණියII | |
| 03 | ශ්‍රේණියI | |

6. දැනට දරන තනතුර :

6.1 තනතුර හා පන්තිය :- ..........................................................................

6.2 පත්වීම් ලිපියේ අංකය :-..........................................................................

6.3 ආදාල පංතියට පත්වීම් ලැබූ දිනය:- ..........................................................................

7.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද ? :-…………………………………………..

(7.1 ඡේදයට අදාළ තොරතුරු නත්නම්)

7.2 එම නැතිනම් මුදල් ගෙවූ මුදල් අණවුමක් අංකය:- ……………………………………………….

7.3 මුදල් අණවුමක් ලබා ගත් තැපැල් කාර්යාලය :- …………………………………………….

**මුදල් ඇණවුම නොගැලවෙන සේ මෙහි අලවන්න**

ඉහත සඳහන් විෂය නිවරදි බවත්, දෙමළ/සිංහල භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම ඇති බවත්, මම විභාගයට ……… වරට පෙනී සිටින බවත්,විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ බවත්/විභාග ගාස්තුවක් රුපියල්……………… වටිනාකමක් ඇති විභාග ගාස්තු……………………තැපැල්කාර්යාලයේ ……………………වැනි අංක දරන ……………………වැනි දිනැති මුදල් ඇණවුම මගින්එවන බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සම්බන්ධයෙන් උතුරු පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ තීරණයටද හා පනවනු ලබන නීතිරීතිවලටද යටත් වන බවද මෙයින් ප්‍රකාශ කරමි.

……………………..

දිනය……………………. අපේක්ෂකයාගේ අත්සන

සටහන.-තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකසහ මා පෞද්ගලිකවශයෙන් දන්නා හඳුනන …………………………මහතා/මහත්මිය/මෙනෙවිය………………………වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් හා නිලධාරියා ප්‍රථම වතාවට විභාගයට පෙනී සිටින නිසා විභාග මුදල ගෙවීමෙන් වලක්විය හකි බවත්/ අදාළ විභාග මුදල ගෙවා ලබාගත් මුදල් අණවුමක් මේ සමග අමුණා ඇති බවත් සහතික කරමි.

………………………..

සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව

නම :-…………………………………………………

පදවි නාමය :-…………………………………………...

ලිපිනය:-……………………………………………

දිනය :-…………………………………………………

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

(i) ඉහත සපයා ඇතිවිස්තර පරීක්ෂා කර බැලු බවත්,

(ii) මෙමනිලධාරියාඒකාබද්ධ සේවයේ සිටින අයෙක් බවත්

(iii) මෙමනිලධාරියාමෙම විභාගයට මීට පෙර පෙනී සිටි/නොසටිබවත්,

(iv) මෙමනිලධාරියාමෙයට පෙර විභාගයට පෙනී සිට ඇතිනිසා නියමිත වටිනාකමින් යුත් මුදල් ඇණවුමඉල්ලුම්පත්‍රයට අමණඇති බවත්,

(v) මෙමනිලධාරියාමෙම විභාගයට පෙනී සිටීමට සුදුසුබවත්,මම සහතික කරමි.

……………………………

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :-………………………………………………

තනතුර :-…………………………………………..

ලිපිනය:-……………………………………………..

දිනය :-………………………………...…………

* අනවශ්‍ය දැ කපා හරින්න.